# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2325/76 – 2023 අප්‍රේල් මස 01 වැනි සෙනසුරදා – 2023.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2021/141.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වැනි පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2023.01.07 වැනි දින අංක 2313/69 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.12.29 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ලංකා බැංකු සේවක සංගමය (එන්. එන්. එස්. සමරකෝන් මයා වෙනුවෙන්), අංක 20, පන්සල පාර, කොළඹ 10.
2. ලංකා බැංකු සේවක සංගමය, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශාඛාව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ඉතිරිකිරීමේ මන්දිරය, අංක 255, ගාලු පාර, කොළඹ 03.

අතර පවත්නා 2022.12.26 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සී. එන්. විතානාච්චි මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු සී. එන්. විතානාච්චි මහතා බේරුම්කාර ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.12.29 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 මාර්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 – 0006/1


1A – G 039261 – 09 (2023/04)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2021/141.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ලංකා බැංකු සේවක සංගමය (එන්. එන්. එස්. සමරකෝන් මයා වෙනුවෙන්), අංක 20, පන්සල පාර, කොළඹ 10.
2. ලංකා බැංකු සේවක සංගමය, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශාඛාව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ඉතිරිකිරීමේ මන්දිරය, අංක 255, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, කළල්ගොඩ පාර, අංක 15, ජෝන් කීල්ස් නිවාස සංකීර්ණය හි, කැප්ටන් එම්. ජී. පී. මෙන්ඩිස් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 මාර්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 – 0006/2

මගේ අංකය: IR/COM/01/2021/141.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ලංකා බැංකු සේවක සංගමය (එන්. එන්. එස්. සමරකෝන් මයා වෙනුවෙන්), අංක 20, පන්සල පාර, කොළඹ 10.
2. ලංකා බැංකු සේවක සංගමය, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශාඛාව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ඉතිරිකිරීමේ මන්දිරය, අංක 255, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි ප්‍රවාහන කළමනාකරු වශයෙන් සේවය කළ එන්. එන්. එස්. සමරකෝන් මහතාට විරුද්ධව පවත්වන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව, ලබා දී ඇති දඬුවම් මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මාර්තු මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 04 – 0006/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.